# ආබාධිත රණවිරුවන්ට නිවාස තනාදීමට ආධාර පිණිස සංගීතමය - සංස්කෘතික මහා සංදර්ශණය

## Sri Lankan Musical & Cultural Show





**Sunday 21 September 2008 at 2.30 pm**

at **The Troxy Theatre**
490 Commercial Road , London E1 0HX
Nearest Railway Station, Lime House (DLR)

Tickets from **£20** under 6 free

Harsha - 07958 309011
Methsiri - 07956 576768
Saliya - 07737 428874
Sekara - 0207 834 0722
Lihiniya - 0208 208 2658
Prince of Ceylon - 0208 203 2121
Wembley Guest House - 0208 902 5297
Defence Advisor SL HC - 07515 834000

**අපි වෙනුවෙන් අපි**
**Be Together For All**

27 Sep. Birmingham
28 Sep. Manchester

මෙම අනගි සංදර්ශණය නැරඹීමෙන් මෙම මහඟු ව්‍යාපෘතියට ඔබත් ආධාර කරන්න!



For further information & to buy tickets online visit:
**www.apiwenuwenapi.co.uk**


# සුනඛයෙකුට මිනිස් අවමඟුල් වතාවත්

**ස**තෙකුට ආදරයෙන් සැලකීම තවත් ඈතට ගෙනයමින් ඒ සතා මියගියවිට තම පවුලේ කෙනෙකුට මෙන් සිදුකළ දුලබ අවසන් ගෞරව දැක්වීමක් මෙසේ ලංකාවෙන් වාර්තා විය.

මේ සුරතල් බල්ලාගේ නම බිංගෝය. හය හැවිරිදි ඌ ජර්මන් ෂෙපර්ඩ් නම් වර්ගයට අයිතිය. ගාල්ලේ මහමෝදර රෝහලේ සේවයේ නියුතු වෛද්‍යවරයෙකුගේ ලබුදූව නිවසේ ඇතිදැඩි කරනු ලැබූ බිංගෝ ට ගෙදර කවුරුත් එකසේ දැඩිසේ ආදරය කළෝ ය. ඌ රෝගාතුරව හදිසියේ මිය යෑම එම පවුලේ කාටත් ඉවසිය නොහැකි දැඩි දුකක් වීය.

වෛද්‍යවරයා, බිරිඳ හා පුත්‍රයා එක්ව ගිය පොසොන් පෝදා බිංගෝගේ අවමඟුල ඉතා ඉහළින් සිදු කළහ. ඒ පළාතේ විහාරස්ථානයකින් භික්ෂූන් වහන්සේලා තුන් නමක් ගෙදරට වැඩම කරවා, පැන්වඩා, මතකවස්ත්‍ර පූජාකොට ඒ ගෙදර ඇත්තෝ සුනඛයාගේ භූමදානය ඉතා ඉහළින් සිදු කළහ. අවමඟුලට වැඩම කළ හිමි නමක් සිය දහම් දෙසුමේදී සඳහන් කළේ මනුෂ්‍යයෙකු මියගිය විට එතරම් ගණනකට නොගන්නා කාලයක සතෙකු වෙනුවෙන් ආගමික වතාවත් සිදු කොට අවසන් ගෞරව දැක්වීම ඉතා උසස් මිනිස් ක්‍රියාවක් බවයි.


බිංගෝ වෙනුවෙන් වෛද්‍යවරයාගේ නිවසේ හත් දවසේ සාංඝික දානයක් ද දෙන්නට නියමිත ය.

# පසුගිය වසර 2 තුළ කොටි ත්‍රස්තයින් 9000 ක් නසිති

**ශ්‍රී** ලංකා රජයේ හමුදා සේනාංක එල්ටීටීඊයට එරෙහිව 2006 වසරේ සිට ආරම්භ කළ මෙහෙයුම් වලින් මේ වසර වන විට කොටි ත්‍රස්තවාදීන් 9000 කට අධික සංඛ්‍යාවක් විනාශ කර ඇති බව හමුදා නායක සරත් පොන්සේකා මහතා ගිය සතියේ පැවති මාධ්‍ය සමුළුවකදී අනාවරණය කළේය.

එසේම ඒ සටන්වලදී රජයේ හමුදා භටයින් සහ පොලිස් නිලධාරීන් 1700 ක් මියගිය බවත් 4000 ක් තුවාල ලැබූ බවත් ඔහු පැවසීය. කොටි සංවිධානය සතුව ඔවුන්ගේ කාඩරයන් තව 5000ක් පමණ සිටින නමුත් ඒ අයට සටන් කිරීමේ හැකියාව හීන බව ද හමුදාපතිවරයා වැඩිදුරටත් ප්‍රකාශ කළේය.

## ♥ පැටියො ඩාලිං



" පැටියො දන්නවයි වැඩක් ? අන්න ඉන්දියාව ආයිත් ලංකාවට අහසින් පරිප්පු දාන්න යනවලු...."

" අයියෝ... මේ සැරෙත් පරිප්පුද? නැද්ද කඩල මුංඇට ටිකක් ? දැන් අපේ මිනිස් සුන්ට පරිප්පු කාලා ඇතිවෙලා ඉන්නෙ.....

# හික්කඩුව පාලම උඩදී කෝච්චිය පීලිපනී

**ප**සුගිය 30 වෙනි දින අනුරාධපුරයේ සිට මාතර බලා ධාවනය වුණු රජරට රැජිණ දුම්රිය උදේ 1030 ට හික්කඩුව හා සීනිගම අතර තොටගමුව පාලම උඩදී පීලි පැනීම නිසා තිදෙනෙකු මියගිය අතර මගීන් 12 දෙනෙක් තුවාල ලැබූහ. පාලම උඩදී වූ මෙම අනතුරින් මගීහු ගඟට වැටුණාහ. ඔවුන් සමහරු ගිලෙන්නට යද්දී නාවුක කිමිදුන් භටයන් වහා කැඳවන ලදුව දියට වැටුණු අය ගොඩගත් නමුත් නව හැවිරිදි දරුවෙක් අතුරුදහන්ව ඇත. තුවාල ලත් මගීන් වහා කරාපිටිය රෝහල වෙත ගෙන යන ලදී.



# Sinhala Lesson 123 සිංහල පාඩම

## සිංහල ඉගෙනීමට පහසු මගක් !

### The Present Active Participle
### වර්තමාන කෘදන්ත ක්‍රියාව

When we want to use **Present Participles** in the form of adjectives, in a sentence along with the finite verb, we use this **Participle.** These are formed by adding the letter න to the base form of the verb.

**Base of verb + න    Some examples:**

බල + න = බලන - බලන කණ්ණාඩිය looking glass
බලන පොත book being looked at
ක + න = කන - කන කෑම food being eaten
කන තැන eating place
බො + න = බොන- බොන වතුර drinking water
බොන මිනිස්සු drinking men
ලිය + න = ලියන- ලියන මේසය writing table
ලියන කඩදාසි writing paper
දුව + න = දුවන - දුවන පාවහන් running shoes
දුවන ළමයි running children
දුවන දුර running distance


Add + න and make Present Active Participles from these verbs - පනිනවා, කපනවා, මරණවා, වවනවා, දෙනවා සිතනවා, සෝදනවා, අරිනවා, උගන්වනවා, යනවා

♦ ආචාර්‍ය සුභද්‍රා සිරිවර්ධන
Dr Subhadra Siriwardane - MA PhD London

# හරස්පද ප්‍රහේලිකා 100

**හරහට :**
1 සිංහබාහුගේ පුත්‍රයා
5 පයිප්ප 6 පිරිසිදු
8 පුරාණයේ පණිවුඩ ලියූවේ මේවායෙහිය
9 සශ්‍රීක 10 නුඹට

**පහළට :**
1 සපාකන
2 දිරායෑම
3 අපායේ මුරකරු
4 අවසාන ගමන මෙතැනට
7 නස්පැත්තිය
10 මහත



***ගියවර නිවැරදි විසඳුම්***

**හරහට:** 1 සිදාදිය 4 තිත 5 සක 7 විමන 9 දවස 11 මක්කම
**පහළට:** 1 සිතිවිලි 2 දාතම 3 යස 6 කලිසම 8 නදක් 10 වක

## නේක රසෙන් පිරිපුන් සිංහල ඉවුම් පිහුම්

# මඤ්ඤොක්කා ව්‍යංජනය
## CASSAVA CURRY

***අවශ්‍ය ද්‍රව්‍ය :***

| | |
|---|---|
| මඤ්ඤොක්කා | රා 1 යි |
| ලියාගත් රතු ළූණු ගෙඩි | 5 යි |
| අමු මිරිස් කරල් | 4 යි |
| පොල් කිරි හෝ full cream milk කෝප්ප | 2 යි |
| මිරිස් කහ සහ තුනපහ කුඩු හා අබ ටික ටික | |
| අවශ්‍ය පමණ ලුණු | |
| කරපිංචා සහ උළු හාල් | |
| උම්බලකඩ කුඩු ටිකක් | |
| එළවළු තෙල් | |

***සාදන ක්‍රමය :*** හොඳට තැම්බෙන පිටි මඤ්ඤොක්කා අල සුද්දකොට කුඩා කැබලිවලට කපා බඳුනකට දමන්න. (බාගෙට තම්බා පැකට් කර ශීතකරණයේ තබා කඩේ ඇති මඤ්ඤොක්කා පැකට් වුවද වරදක් නැත) දැන් ඒ බඳුනටම රතුළූනු, කහ, තුනපහ, මිරිස්, උළුහාල් ආදී සියළු කළමනා දමා වතුර පීරිසි කෝප්පයක් ද වත්කර ලිප තබන්න. මඤ්ඤොක්කා හොඳට තැම්බුණු පසු උවමනා පමණට ලුණු යොදන්න. ඉන්පසු අඹරාගත් අබ ටික කිරිවලට හොඳින් කළවම් කර මඤ්ඤොක්කා වලට වත්කර හැඳි ගා මඳ වේලාවක් වසා තබන්න. ව්‍යාංජනය නටන විට කැමති නම් එය තෙම්පරාදු කොට බැදපු තුනපහ කුඩු ටිකක් උඩින් ඉහින්න.

♥ නිරූපා විජයතුංග *Edgware Middx UK*


**Sam's** CHICKEN CHICKEN CHICKEN

**Great Tasting! Great Value!**

17 HIGH STREET, WEALDSTONE, HARROW HA3 5BY, TEL: 020 8861 1872
439 HIGH ROAD, WILESDEN, LONDON NW10 2JJ, TEL: 020 8451 7662
84 HIGH STREET, HARLESDEN, LONDON NW10 42J, TEL: 020 8838 2036
246 KINGSBURY ROAD, KINGSBURY, LONDON NW9 9HN, TEL: 020 8204 1432

සැම්ස් චිකන්